# පාසැලෙන් කෙතට ගොස්....

මේ ජගත් තරුණ වසරයි. විවිධ අංශ වලින් ඉදිරියට එන තරුණයින් ජන සන්නිවේදන මාර්ග වලින් හඳුන්වා දීම දැන් නිරතුරුව දක්නට ලැබේ. රට වෙනුවෙන් දහඩිය හෙළන ගොවි කටයුතු ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ අංශ වලට අයත් තරුණ තරුණියන් හමුවීමට 'ගොවිජනතාව' දැරූ උත්සාහයන් සපල වුනා.

ගල්ගමුවේ පොල් සංවර්ධන නිලධාරී ලයනල් විජේසිංහ අපට පළමුවෙන්ම අදහස් ප්‍රකාශ කළ අය අතර විය. ඔහු 26 වියැති තරුණයෙකි. කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයයේ ඩිප්ලෝමාව සමත් ඔහු දැක්වූ අදහස් කෘෂිකාර්මික අධ්‍යාපනය පිළිබඳ නව පරපුරේ ආකල්ප ලෙස හඳුන්විය හැකිය.

"මම අ. පො. ස. (උසස් පෙළ) පන්තියේදී කල්පනා කළා ජීවන වෘත්තිය වශයෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියාවක් තෝරාගන්න. ඒ අනුව, මම කෘෂිකර්ම විද්‍යාලයට ඇතුල්වී, මගේ අධ්‍යාපනය ගෙන ගියා. අද කෘෂිකාර්මික අධ්‍යාපනයක් ලත් අයට රැකියා අවස්ථා සුලබයි. අනික් අතට රජයේ රැකියා නැතත්, තමන් ලත් දැනීමෙන් වෘත්තීය ගොවියෙක් වශයෙන් ස්වාධීනව දියුණුවිය හැකිය. ඒ විදියට දියුණුවී විශාල ගොවිපලවල් පවත්වා ගෙන යන අය ගණනාවක් අද රටේ ඉන්නවා."

විජේසිංහගේ අදහස අද රටේ අධ්‍යාපනය ගැන පවතින ආකල්ප පුළුල් වී ඇති බවයි. එදා දොස්තරුන්, නීතිඥයින් සහ ඉංජිනේරුවන් වීමට තිබූ සම්ප්‍රදායික කැමැත්ත වෙනුවට අද විවිධ අංශ වලට තම අධ්‍යාපනය යොමු කරන්න තරුණයින් කැමැතියි. විශේෂයෙන්ම ගොවි තැනට බහින ඕනෑම කෙනෙකුට කෘෂිකර්ම විද්‍යාලයක අධ්‍යාපනය ලැබීම ඉතාම ප්‍රයෝජනවත් බව ඔහුගේ අදහස විය.

නාලපහ පදිංචි විජිත තෙන්නකෝන් ඊළඟට අපට හමුවුනා. ඔහු කිරි පිණිස හරක් ඇතිකරන තරුණ ගොවියෙක්. උසස් පෙළ සමත්ව එහෙත් රජයේ රැකියාවක් සඳහා නොගොස් සතුට



කෘෂිකර්මයට කැපවූ තරුණ ජිවිත; අනාගතයේ ජීවයයි.

# රැකියා මිරිඟුවට අභියෝගයක්

ලිව්වේ —

**ලලිත් ජයසූරිය**

පාලනය ජීවන වෘත්තිය ලෙස තෝරාගෙන ඇති මේ තරුණයා ගෙන් ඊට හේතුව විමසුවෙමු.

### වැඩි ආදායමක්

"අද රජයේ රැකියාවකට දිනපතා කොළඹට එනවා කියන්නේ, හිඟා කෑමක් වගේ වැඩක්. බොහෝ අය දැන් එය කරන්නේ සමාජ තත්වය සඳහා පමණයි. කොළඹ දිනපතා යන්න එන්නත්, ආහාර පානාදියටත් දිනකට රුපියල් තිහක් වත් වැය කරන බොහෝ රජයේ සේවකයින්ට දවසකට ලැබෙන වැටුප රුපියල් හතලිහකටත් අඩුයි. ඉතින් ඊට වඩා බොහොම සනීපයි ගමට වෙලා හරක් බානක් දෙකක් ඇති කරගෙන පොල්ගස් ටිකට පෝර දමාගෙන ඉන්න එක."

ඔහුගේ චින්තනය රජයේ රැකියා මිරිඟුව පසුපස දිවයන අයට අභියෝගයක්. අනිත් අතට ඔහු තම වෘත්තියේ සාර්ථකත්වය පිළිබඳ මෙසේ කරුණු දැක්වූවා.

"මම කිරි ලීටර් 50 ක් පමණ දිනපතා සමුප-කාරයට භාර දෙනවා. දවසකට රුපියල් සීයක පමණ ලාභයක් ලබා ගන්නවා. මගේ රැකියාව කාටවත් යටත් නැහැ. අපි පසුගිය හය වසර තුල කිරි එකතු කරන සමුපකාරයක් ඇතිකර දියුණු කරලා තිබෙනවා. පශු වෛද්‍ය අංශ වල සහයෝගය ඉතාම වැදගත්. විශේෂයෙන්ම දියුණු දෙනුන් වර්ග තෝරා ගන්න ඕනැ. ඒවාගේම ලෙඩරෝග සහ බෙහෙත් ගැන හොඳ දැනීමක් ලබාගත යුතුව තිබෙනවා. කිරි හරක් ඇති කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගන්න පුළුවන් එහෙම වුනොත් පමණයි."

### යෝගට් නිෂ්පාදනය

සම්ප්‍රදායික අමුද්‍රව්‍ය වලට වඩා නිමි ද්‍රව්‍ය අලෙවිය ලාබදායිබව අමුතුවෙන් කිවයුතු නැහැ. ඒත් අපේ වැඩිහිටි පරපුර ඊට පෙළඹී ඇත්තේ ඉතාම අඩුවෙන්. තරුණයින් මෙහිදී ඊට වඩා ඉදිරි යෙන් සිටින බව අපට පෙනුනා.

උඩුගම එස්. පී. ප්‍රේමරත්න එවැන්නෙකි. මධස්ථානයට දිනපතා කිරි අලෙවියෙන් තම සත්ව ගොවිපල පවත්වා ගෙන ආ ඔහු දියුණු කළ එළ හරකුන්ට අමතරව මී දෙනුන් ඇති කිරීම ආරම්භ කළා. දැන් ඔහු හොඳ මුදවාපු කිරි නිෂ්පාදකයෙකි. වියලි කලාපයේදී නම් මුදවාපු කිරි නිෂ්පාදනය අරුමයක් නොවෙයි. ඒත් තෙත් කලාපයේ ගොවියෙක් මුදවාපු කිරි නිපැයුමට අත ගැසුවේ කලාතුරකිනි.

"මගේ බලාපොරොත්තුව අප ප්‍රදේශයේ වෙළඳ පල සඳහා හොඳ මුදවාපු කිරි වලට අමතරව යෝගට් නිෂ්පාදනය කර සපයන්නයි. ඒ ගැන මේ දිනවල කරුණු ඉගෙන ගනිමින් සිටිනව."

කලින් කිරි මණ්ඩලයට සීමා වුණු යෝගට් නිෂ්පාදනයට අද ගම්බද තරුණයන්ද අතගසා ඇත. මෙයින් පෙනෙන්නේ ගොවි තරුණයින් මගින් ගම්බද ප්‍රදේශ වලටත් නව තාක්ෂණය ගලා ගොස් ඇති බවද නොවේද?

අපට තම අදහස් ප්‍රකාශ කළ ඊළඟ තරුණයා වූයේ මැදනගම්පිටියේ එස්. පී ධර්මසේනයි. ඔහු අටවැන්නේදී පාසැල් අධ්‍යාපනය නවත්වා දමා බුලත් ගොවිතැනට බැස්ස පුද්ගලයෙකි. සතියකට බුලත් දහ දහක් තරමේ වෙළෙඳ පලට ගෙන යන ඔහු සමාජ ඇසුරින් පරිණත වූ තම ආකල්ප මෙසේ ප්‍රකාශ කළා.

### බුලත් වගාව

"බුලත් වගාව වාසනාව හෝ අවාසනාව මත ආදායම දෙන එකක් කීවොත් නිවැරදියි. බුලත් වලට කවදාවත් ස්ථිර මිලක් තිබුණේ නැහැ. නමුත් ගොවියෙකුට තම ගෙවත්තේ වගාවක් ලෙස බුලත් පාත්ති කීපයක් හද ගත්තොත්, ඉන් ගෙදරට අමතර ආදායමක් වගේම හිතට හොඳ වින්දනයකුත් ලැබෙනවා. පකිස්ථානය වගේ රටවලට බුලත් පටවන ආයතන කීපයක් තිබුණත් බුලත් මිල, තීරණය වන්නේ ඒ රටවල ඉල්ලුමට වඩා අපේ රටේ කාල ගුණය ආදී සාධක උඩයි. ඒක තමයි ගොවීන්ට තිබෙන ලොකුම ප්‍රශ්ණය.

තරුණ වර්ෂය සහ කෘෂිකර්මය ගැන කතා කරන අපට අමතක කරන්න බැරි අංශයක් තමයි තරුණ ගොවි සමාජ. දීර්ඝ කාලයක් තිස්සේ නොයෙකුත් වැඩ සටහන් මෙහෙයවලා ලංකාව පුරා නමක් දිනූ මේ ව්‍යාපාරයට අයත් තරුණ ගොවි සමාජ බොහොමයක් අද නිශ්ශබ්ද වෙලා තියෙන බව දකින්න ලැබුනා.

ඒ ගැන අදහස් දුන්නේ දියුණු තරුණ ගොවි සමාජයක සාමාජිකයෙක් වූ යටගම චන්ද්‍ර සෙනෙවිරත්නයි.

### අනාගතයට [illegible]ඳුවක්

"තරුණ වයස හැමදම පවතින එකක් නොවෙයි. අතීත තරුණ ගොවි සමාජ උද්‍යෝගි-මත්ව පවත්වාගෙන යන තරුණ තරුණියක් මුහුකුරා යන විටදී නායකයින් සඳහා ඊළඟ වයස් කාණ්ඩයේ අය පුහුණු කර නොතිබුණොත් සිදු වන්නේ සංවිධානය කඩා හැලෙන එකයි. ඒ වගේම නොවීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පැත්තෙනුත් කළයුතු දේ තිබෙනවා. විශේෂයෙන්ම, එදා ගොවි සමාජ වලට හිමිවූ වරප්‍රසාද ආදිය අද වෙනත් සංවිධාන වර්ග වලට හිමිව ඇති නිසාත්, තරුණයින් ගොවිසමාජ වැඩ පිළිවෙලින් ඈත්ව යනවා."

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේදී තරුණියන් සතුව ඇත්තේ, කියා නිම කළ නොහැකි තරම් විශාල කාර්ය භාරයකි. මෑතකදී දක්නට ලැබුණු එක් අංශයක් නම් කෘෂිකාර්මික නිෂ්පාදන යැකසීමේ ව්‍යාපාරයයි. මිනුවන්ගොඩ පිහිටි ප්‍රධාන පලේ කජු සැකසීමේ ව්‍යාපෘතියක සේවය කරන නන්ද පියසීලි තම අදහස් මෙසේ දැක්වූවා.

"අපි කජු සකස් කිරීමට පෙර, ගොවියකුට කජු ගෙඩියකට ලැබුණේ ශත 2 - 3 ක් පමණයි. නමුත් අද, කජු ගෙඩියකට ශත 15 - 20 ක් ගොවියකුට ලැබෙනවා. අපි අමුකජු එකතු කර සකස් කිරීමෙන් පසු පිටරට යනවා. ඉන් සිය ගණනකට රැකියා මෙන් රටට අවශ්‍ය විදේශ විනිමයද ගලා එනවා. සෑම කෘෂි ද්‍රව්‍යයක් ගැනම තම දැනුම යොමු කරලා යමක් නිපදවීම අද තරුණ පරපුරේ වගකීමක්."

අය තම මතය එසේ පළ කළා. අපි බොහෝ දෙනාට සම්මාන පුද කරමු. කවියන්ට, ලේඛකයින්ට, නළුවන්ට, ක්‍රීඩකයින්ට සම්මාන පුද කිරීමට ඔසවන දෑත් දහඩිය හෙලන තරුණ ගොවින්ටද සම්මාන පිදීම සඳහා යොමුවේවායි පතමින් අපේ ගොවි මිත්‍රයින් ගෙන් සමු ගත්තෙමු.



තරුණියන්ටද ගොවිපල තෝතැන්නක්